# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2010 මැයි මස 07 වන දින

## II වන කොටස

## අතිරේකය

(2010.05.10 දින නිකුත් කරන ලදී)

# පිළියන්දල ධර්මශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ)

**පිළියන්දල ධර්මශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

ගම්පහ දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කරු ජයසූරිය මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) 1998 අංක 60 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම (සන්නද්ධ හමුදා) පනතට 4අ යන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් එකී පනත සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නෛතික බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ 3 සහ 4 වන වගන්ති බලපාන්නාවූ "සන්නද්ධ හමුදා සාමාජිකයකු" යන යෙදුම නිර්වචනය කිරීම වන්නේ ය.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4අ වගන්තියට ඉක්බිතිවම 4ආ, 4ඇ, 4ඈ, 4ඉ සහ 4ඊ යන අළුත් වගන්ති ඇතුළත් කිරීම මගින් එකී පනත සංශෝධනය කරනු ලබන අතර, අලුත් වගන්තිවල නීතිය බලපෑම වන්නේ —

(අ) විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

(i) සන්නද්ධ හමුදාවල නිත්‍ය උපසේවා, ස්වේච්ඡා බලකාය සහ ස්වේච්ඡා උපසේවාවේ සාමාජිකාවන් ට ද;

(ii) මේ සංශෝධනය ක්‍රියාත්මක වන දිනට පසු සන්නද්ධ හමුදාවල සාමාජිකාවන් වන්නා වූ තැනැත්තන්ට ද; සහ

(iii) ක්‍රියාන්විත රාජකාරී ආදිය ඉටුකිරීමේ දී සිදු වූ තුවාල හේතු කොට ආබාධිත තත්ත්වයට පත්වනු ලබන සන්නද්ධ හමුදාවල සාමාජිකාවන්ට ද,

බලපාන අයුරින් ව්‍යාප්ත කිරීම.

(ආ) ප්‍රධාන ප්‍රඥප්තියේ 4ආ, 4ඇ සහ 4ඈ වගන්තිවල කාර්ය සඳහා "නිත්‍ය උපසේවා බලකාය, ස්වේච්ඡා බලකාය හෝ ස්වේච්ඡා උපසේවා බලකායේ සාමාජිකයන්" යන යෙදුම නිර්වචනය කිරීම ද වේ.

## පිළියන්දල ධර්මශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ)

එල්. ඩී.—ඕ. (අයි. එන්. සී.) 61/92.

## පිළියන්දල ධර්මශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"පිළියන්දල ධර්මශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන සභාවක්, ඒ සභාවේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ සභාවේ පරමාර්ථ සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සහ ඒ සභාවට සම්බන්ධ සියලු කරුණු සාර්ථක ලෙස ඉටු කිරීම සඳහා මෙතෙක් කල් පිළියන්දල පිහිටුවා තිබුණු හෙයින් ද:

ඒ සභාව පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු වඩාත් සඵලාකාරයෙන් ඉටු කිරීමට ඒ සභාවට හැකිවනු පිණිස ඒ සභාව සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2010 අංක  දරන පිළියන්දල ධර්මශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

පිළියන්දල ධර්ම ශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පිළියන්දල ධර්මශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාවේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයන් "පිළියන්දල ධර්මශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ

2—PL 004821 — 100 (2010/05)

ද සම්පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. තව ද එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කිරීමට අරමුණු කොටගත් පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) විහාරස්ථානය සතු ගොඩනැගිලි නඩත්තු කරගෙන යාම සහ අවශ්‍ය වන පරිදි නව ගොඩනැගිලි ඉදි කිරීම සහ ඒවා නඩත්තු කිරීම;

(ආ) බෞද්ධ ජනතාව තුළ සහ ප්‍රදේශවාසී ජනතාව තුළ ශාසනික ප්‍රබෝධය ඇති වන සේ කටයුතු සංවිධානය කිරීම;

(ඇ) සාමාජිකයන්ගේ ආගමික, සංස්කෘතික, සාමාජික හා සෞඛ්‍යමය සුභසාධන සේවා පවත්වාගෙන යාම, ඒවාට ධෛර්ය දීම සහ ආධාර කිරීම;

(ඈ) බුද්ධ ධර්මය ආරක්ෂා කිරීම හා ප්‍රචාරය කිරීම;

(ඉ) ආරණ්‍ය සේනාසන හා යෝගාශ්‍රම පිහිටුවීම සහ සංස්ථාවේ මූලික පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා උචිත පාරිසරික පහසුකම් සැලසීම;

(ඊ) නිසි සුදුසුකම් සහ ආගමික ශ්‍රද්ධාව ඇති කුලපුත්‍රයන් සසුන් ගත කිරීම සහ උන්වහන්සේලාට සිව්පසයෙන් උපස්ථාන කිරීම;

(උ) ථෙරවාදී බෞද්ධ දර්ශනය සහ ජීවන මාර්ගය ආරක්ෂා කිරීම හා ප්‍රචාරය කිරීම;

(ඌ) ශ්‍රී ලංකාවේ හා පිටරට පිහිටි වෙනත් බෞද්ධ සංවිධාන සමග මිත්‍ර සම්බන්ධතා පවත්වාගෙන යාම;

(එ) ගිලන් භික්ෂූන් සඳහා ආරෝග්‍ය ශාලාවක් ආරම්භ කිරීම සහ වනවාසී සියලු භික්ෂූන්ට වෛද්‍ය පහසුකම් සැලසීම;

(ඒ) භික්ෂූන්ට ධර්මය සහ විනය ඉගැන්වීම, යෝගාභ්‍යාස පුහුණු කිරීම, පාලි, සිංහල සහ වෙනත් පෙර අපර භාෂා පිළිබඳ ප්‍රවීණත්වය ලබා දීම;

(ඔ) බාල පරපුරට ධර්මඥානය ලබා දීම සඳහා දහම් පාසල් පිහිටුවීම;

(ඕ) ලෝක සාමය උදෙසා බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම්වල අන්තර්ගත පණිවුඩය සහ බෞද්ධ සංස්කෘතිය පතුරුවා හැරීම;

(ක) අධ්‍යාපනය, සංස්කෘතිය, සන්නිවේදනය, නිරුපද්‍රිත පැවැත්ම, සංවර්ධනය හා සාමය පිළිබඳ ලෝක ප්‍රශ්න සාකච්ඡා කිරීම සඳහා රාජ්‍ය සංවිධාන වන හෝ නොවන ආගමික හෝ ගිහි ජාත්‍යන්තර සංවිධාන මගින් කැඳවනු ලබන සම්මන්ත්‍රණවල දී හා සම්මේලනවල දී බෞද්ධ ප්‍රජාව වෙනුවෙන් බෞද්ධ මතය ඉදිරිපත් කිරීම;

(ග) නිරුපද්‍රිත පැවැත්ම, සංවර්ධනය, සාමය, අධ්‍යාපනය හා සංස්කෘතිය පිළිබඳ ප්‍රශ්නවලට අදාළ අධ්‍යයන බෞද්ධ දර්ශනයට අනුව ආරම්භ කිරීම, සමායෝජනය කිරීම හා ඒවාට ආධාර කිරීම සහ එවැනි අධ්‍යයනවල ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීම;

(ජ) ලෝක බෞද්ධ නායකයන්ට හා විද්වතුන්ට එක්රැස්වී සාකච්ඡා කිරීමට පහසුකම් සැලසීම;

(ට) සාමය අරමුණු කොටගත් බෞද්ධ අධ්‍යයන කණ්ඩායම්, භාවනා කණ්ඩායම්, ජනමාධ්‍ය කණ්ඩායම් හා ක්‍රියාකාරී කණ්ඩායම් සඳහා ලේඛන මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියා කිරීම සහ තොරතුරු හුවමාරු කර ගැනීමට හා අත්දැකීම් බෙදාහදා ගැනීමට සැලැස්වීම;

(ඩ) පොත්, පර්යේෂණ වාර්තා, වාර ප්‍රකාශන, වෙනත් ලේඛන, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ, චිත්‍රපටි හා කැසට් ඇතුළත් පුස්තකාලයක් පිහිටුවීම සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට හිතකර යයි සලකනු ලබන වෙනත් සේවා සැපයීම;

(ණ) බෞද්ධ පිළිවෙතට අනුව, මානසික සෞඛ්‍යයට, පෞරුෂ සංවර්ධනයට, ජාතික සමගියට හා ලෝක සාමයට ඉවහල් වන, ප්‍රඥාව හා කරුණාව මත පදනම් කරගත් සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණු පාඨමාලා, තරුණයන් හා තරුණ නායකයන් සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම;

(ත) ලෝක සාමය ඇති කිරීම සඳහා ලෝක බෞද්ධ සම්මේලනය හා රාජ්‍ය සංවිධාන වන හෝ නොවන ආගමික හෝ ගිහි ජාත්‍යන්තර වෙනත් සංවිධාන සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම;

(ද) සමකාලීන සමාජයට ගැලපෙන අධ්‍යාපනික න්‍යායයන් සකස්කර ගැනීම සඳහා ආගමික, අධ්‍යාපනික දර්ශනයන්, බෞද්ධ අධ්‍යාපන දර්ශනය, නූතන අධ්‍යාපන දර්ශනය සමග තුලනාත්මකව හැදෑරීම;

(න) ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට වෘත්තීය අධ්‍යාපන පාඨමාලා පැවැත්වීම;

(ප) ශිෂ්‍යයන්ට කුඩා කර්මාන්තවල පුහුණුව ලබා දීම සහ ප්‍රයෝජනවත් පුරවැසියන් වශයෙන් ස්ථාපනය වීම පිණිස ඔවුන්ට මුදලින් හෝ අන්‍යාකාරයෙන් උපකාර කිරීම;

(බ) පාසල් සහ අධ්‍යාපන ආයතන පිහිටුවා නඩත්තු කිරීමෙන් සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමෙන් අධ්‍යාපනය නංවාලීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ම) දුප්පත්, අනාථ සහ රෝගී තැනැත්තන්ට වෛද්‍ය සහන, ආහාර, ඇඳුම් පැළඳුම් සහ නිවාස සැපයීම;

(ය) අනාථ නිවාස, මහලු නිවාස සහ අසරණ අය සඳහා නිවාස පිහිටුවීම සහ පවත්වාගෙන යාම සහ සමාජ සුභසාධන මධ්‍යස්ථාන පිහිටුවීම;

(ර) අඳ, ගොළු, බිහිරි සහ ආබාධිත තැනැත්තන් සඳහා සුභසාධන පහසුකම් සැලසීම;

(ල) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කරගැනීමෙහිලා නිරතවන භික්ෂූන් වහන්සේලාට, ස්වේච්ඡා සේවකයින්ට සහ වෙනත් තැනැත්තන්ට ශිෂ්‍යත්ව මගින් හෝ මුදලින් හෝ අන්‍යාකාරයකින් ආධාර දීම;

(ව) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රදර්ශන, දේශන, සම්මන්ත්‍රණ, දාර්ශනික සාකච්ඡා, වැඩමුළු, පන්ති, විවාද, සම්මේලන, චාරිකා, විනෝද ගමන් හෝ වෙනත් කටයුතු ප්‍රවර්ධනය කිරීම, පිළියෙල කිරීම, සංවිධානය කිරීම හා පැවැත්වීම;

(ස) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් සංගම්, සමිති හෝ සංවිධාන සමග සහයෝගී වීම සහ සහචර්ය වීම;

(හ) යම් කර්මාන්තයක හෝ වෙළඳාමක නැතහොත් යම් අපනයන හෝ ආනයන ව්‍යාපාරයක නිරතවීම සහ කෘෂිකාර්මික, කාර්මික සහ වාණිජ ව්‍යාපාර සහ අපනයනය කිරීම වැනි කර්මාන්ත ආරම්භ කොට පවත්වාගෙන යාමට තැනැත්තන්ට ආධාර දීම හෝ සහාය වීම සහ තාක්ෂණය සහ ශිල්පීය ක්‍රම ජනතාවට හඳුන්වා දීම සඳහා පුහුණු කිරීමේ වැඩසටහන් ව්‍යාප්ත කිරීම, සේවාවන් හා ප්‍රචාරක කටයුතු සංවිධානය කිරීම; සහ

(ළ) ඉහත සඳහන් පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් මුදුන් පත්කර ගැනීම සඳහා අවශ්‍ය, හිතකර හෝ ආනුෂංගික වන වෙනත් ක්‍රියා සහ දේවල් කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් හා පරිත්‍යාගයන් භාර ගැනීමේ හා එකතු කිරීමේ ද ස්වකීය අරමුදල් ආයෝජන කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයින් සේවයේ නියුක්ත කරගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පමාර්ථ සියල්ලම හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියාවන් කිරීමේ, දේවල් ඉටු කිරීමේ හා කාරණා ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු, අධ්‍යක්ෂ ජනරාල්, ගරු ලේකම්, ගරු භාණ්ඩාගාරික සහ සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි සහ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන හය දෙනකුට නොඅඩු වෙනත් සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ කළමනාකාර කමිටුවක් විසින්, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද පිළියන්දල ධර්මශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථානාධිපති පෙතිගමුවේ රාහුල ස්වාමීන්ද්‍රයන්වහන්සේ කලින් ඉල්ලා අස්වුවහොත් මිස සංස්ථාවේ යාවජීව අධ්‍යක්ෂ ජනරාල් විය යුතු අතර, උන්වහන්සේගෙන් පසු අධ්‍යක්ෂ ජනරාල් ධුරයට උන්වහන්සේගේ අනුප්‍රාප්තිකයා උන්වහන්සේ විසින් නම් කරනු ලැබිය යුතු ය. එසේ අනුප්‍රාප්ත වන අධ්‍යක්ෂ ජනරාල්වරයා ද කලින් ඉල්ලා අස්වුවහොත් මිස යාවජීව අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් වන්නේ ය.

(3) සංස්ථාවේ ප්‍රථම කළමනාකාර කමිටුව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සභාවේ කළමනාකාර කමිටුවේ සාමාජිකත්වය දැරුවා වූ ද මෙහි උපලේඛනයේ නම් සඳහන් කොට ඇත්තා වූ ද තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින්, කලින් කල, යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන්, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ නෙරපීම;

(ආ) නිලතල දරන්නන් තෝරා පත් කිරීම, ඔවුන් ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුර අත් හැරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, පැවැත්ම සහ කාර්ය;

(ඇ) කළමනාකාර කමිටුවේ සාමාජිකයන් තෝරා පත්කිරීම ඔවුන්ගේ බලතල, පැවැත්ම සහ කාර්ය;

(ඈ) සංස්ථාවේ, කළමනාකාර කමිටුවේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, එම රැස්වීම් පැවැත්විය යුතු වේලාව, ස්ථානය, ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, එහි ගණපූරණය සහ එහි දී කටයුතු කර ගෙන යාම;

(ඉ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, පැවැත්ම, කාර්ය සහ කර්තව්‍ය;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම සහ සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ එහි ගිණුම් තැබීම හා විගණනය කිරීම; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක්, (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන පරිද්දෙන් එවැනිම රැස්වීමක දී, එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සභාවේ බලපැවැත්වූ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට, මේ වගන්තිය යටතේ සාදන ලද රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ තත්කාලයේ බල පවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සභාව විසින් සහ සභාවට ගෙවිය යුතු ණය.

**7.** මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි සභාවෙහි පවත්නා සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට සභාවට ගෙවිය යුතු සියලු ණය, ග්‍රාහක මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**8.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, බද්දක් හෝ තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය සහ ශක්නුතාව ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**9.** කළමනාකාර කමිටුවේ සාමාජිකයකු සහ ගරු ලේකම්වරයා හෝ කළමනාකාර කමිටුව විසින් යථා පරිදි බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු හෝ ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කවර වූ යම් සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**10.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම් වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

**11.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**උපලේඛනය** [5 (3) වගන්තිය]

අධ්‍යක්ෂ ජනරාල් : පෙතිගමුවේ රාහුල හිමිපාණන් වහන්සේ

ලේකම් : එච්. ඒ. චන්ද්‍රදාස නාදුගල මයා

භාණ්ඩාගාරික : සුනිල් පෙරේරා මයා

උප සභාපති : පියසිරි රාජපක්ෂ මයා

උප ලේකම් : පී. පී. ගමගේ මයා

ප්‍රධාන ගිහි අනුශාසක : සිරිනාල් ද මැල් මැතිතුමා
ඩෙන්සිල් අපොන්සු මහතා
ඩී. එල්. ඩබ්ලිව්. කුමාරගේ මයා

ගණන් පරීක්ෂක : මංජුල සමරසේකර මයා

කාරක සභාව : ජගත් රත්නපාල මයා
කේ. පී. ගුණසේන මයා
මානෙල් පෙරේරා මහත්මිය
යසවතී නේරංගල මහත්මිය
වයි. මුණසිංහ මහත්මිය
ලලිත් හෙට්ටිආරච්චි මයා
එම්. ඒ. ප්‍රේමදාස මයා

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.